**අගලවත්ත ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 17 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1:3:2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී 2013 වර්ෂය වෙනුවෙන් ලැබී, කලින් ලැබීමේ ගිණුමේ සටහන් කර තිබූ වෙළඳ බලපත්‍ර රු.10,000 , ව්‍යාපාර බදු රු.6,880 ක් හා අක්කර බදු රු.2,373 ක් සමාලෝචිත වර්ෂයේදී කලින් ලැබීම් ගිණුම හර කර අදාල ආදායම් ගිණුම් බැර කළ යුතු වුවත් ඉහත රු.19,253 ක මුදල සමුච්චිත අරමුදලට කපා හැර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

(ආ) ලෙජර ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වියදම් ණයහිමි ගිණුමේ ශේෂය රු.29,575,556 ක් වුවද ශේෂ පිරික්සුමට රු.29,389,080 ක් ලෙස ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 22 ක් සඳහා උපචිත කර තිබූ වියදම රු.4,615,880 ක් වුවද, ණයහිමි ගිණුමට රු.14,046,734 ක් වර්ෂයේ ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. මේ සඳහා ජර්නල් සටහනක්ද ලියා නොතිබුණි.

(ඈ) ගෙවීම් සාරාංශය අනුව වැය විෂයයන් 20 කට අදාල වර්ෂයේ වියදම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් ගැලපීමෙන් පසු වර්ෂයේ වියදම රු.22,178,943 ක් විය යුතු වුවද රු.27,468,023 ක් ලෙස ගෙන ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර තිබීම නිසා වර්ෂයේ වියදම රු.5,289,080 කින් වැඩියෙන් දැක්විණි.

(ඉ) ආදායම් ශීර්ෂ 04 ක මුදල් ලැබීම් අදාල ආදායම් ගිණුම්වල ආරම්භක හා අවසාන ශේෂවලට ගැලපීම් නොකර රු.6,765,228 ක් ආදායම් හා වියදම් ගිණුමට ගිණුම ගත කර තිබුණද

නිවැරදි ආදායම රු.7,038,802 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.273,574 ක් අඩුවෙන් දැක්විණි.

(ඊ) 2013 අප්‍රේල් මාසයේ වවුචර් අංක 61 න් ණයහිමි ගෙවීම් රු.99,745 ක් ණයහිමි ගිණුම හර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වැය ගිණුම හර කර තිබීමෙන් වර්ෂයේ වියදම හා ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ වරිපනම් බදු, අක්කර බදු, ව්‍යාපාර බදු සඳහා පිළිවෙලින් රු.83,689 ක්, රු.2,599 ක්, හා රු.6,950 ක් මුදල් ගිණුම හර කර කලින් ලැබීම් ගිණුම බැර කළ යුතු වුවත් මුදල් ගිණුම හර කර නැවතත් අදාල ආදායම් ගිණුම් හර කර තිබුණි.

(ඌ) සාරාංශ ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායම් ලැබීම් රු.5,906,422 ක් වුවද, ලෙජර ගිණුමට මුදල් ලැබීම් ලෙස රු.5,910,587 ක් බැර කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවා තිබූ පොලී රු.41, 415 ක් හා වරිපනම් හා අක්කර බදු සඳහා දුන් වට්ටම් රු.50,924 ක් වියදමක් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඒ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ණය පදනම මත සභාවට ලබා දී තිබූ කැබ් රථයේ ණය ශේෂය වූ රු.3,178,457 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඔ) සභාවේ පොදු ගිණුමට අදාල සාරාංශ වියදම් ලේඛනය (ප්‍රා.ස.20) අනුව සේවක ණය ගෙවීම් රු.595,000 ක් වුවද, 2013 දෙසැම්බර් 31 ට ලබා දී තිබූ ගෙවීම් සාරාංශය අනුව සේවක ණය ගෙවීම් රු.209, 690 ක් විය. එසේම සේවක ණය ජංගම ගිණුමෙන් කර තිබූ සේවක ණය ගෙවීම් රු.776, 673 ක් සමඟ වර්ෂයේ මුළු සේවක ණය ගෙවීම් රු.1, 371,574 ක් වුවද ලෙජර් ගිණුමට රු.916, 454 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඕ) ගෙවිය යුතු මුද්දර බදු ලෙජර ගිණුමේ රු.25,485 ක මුදල් ගෙවීමක් ගිණුම් ගත කර තිබුණද එවැනි ගෙවීමක් මුදල් පොතේ හෝ ගෙවීම් සාරාංශ ලේඛනයේ සටහන් වී නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.156,807,819 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.6,465,286 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 3,062,678 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 2,538 | 2,226 | 468 |
| (ii.) බදු කුලී | 870 | 870 | 745 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 145 | 144 | 925 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 4,231,075 |
| (ii) | මුද්දර ගාස්තු | 852,162 |

2.2.3 වෙනත් ආදායම්

1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 ඒ (1) වගන්තිය ප්‍රකාරව අනුමත කර තිබූ ඉඩම් අනුබෙදුම් 2 ක් සඳහා අනුකූලතා සහතික ලබා ගෙන නොතිබුණෙන් රු.10,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) <u>සභා කර්මාන්ත</u>

ඇස්තමේන්තු වටිනාකම රු.2,164,481 ක් වූ කර්මාන්ත 6 ක් ඉටු කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) <u>මග නැගුම ව්‍යාපෘතිය යටතේ වූ කර්මාන්ත</u>

මග නැගුම වැඩ සටහන යටතේ කර්මාන්ත 120 ක් අනුමත වී තිබුණද ඉන් ඉටු කර තිබුණේ ඇස්තමේන්තුගත වටිනාකම රු.10,771,902 ක් වූ කර්මාන්ත 22 ක් පමණි.

2013 වර්ෂයේදී රු.35,000,900 ක අගයකට ගිවිසුම් ගත වී තිබූ කර්මාන්ත 67 ක් විගණිත දිනය වූ 2014 පෙබරවාරි 18 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.
වටිනාකම රු.9,425,967 ක් වූ කර්මාන්ත 18 ක් වෙනුවෙන් ඇස්තමේන්තු පමණක් අත්සන් කර තිබූ අතර අනුමත මුදල රු.6,700,000 ක් වූ කර්මාන්ත 13 ක් සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි.

(ඇ) <u>උඩවෙල තලගහලියද්ද මාර්ගය 1, 2 හා 3 අදියර</u>

මෙම මාර්ගය දිග මීටර් 251 ක්ද, පළල මීටර් 2.44 ක්ද කුට්ටි ගල් අතුරා සකස් කිරීමට රු.1,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2014 පෙබරවාරි 19 දින සභාවේ තාක්ෂණික නිලධාරී සමඟ කර්මාන්ත සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගය නිශ්චිතව හඳුනාගැනීමට හැකි වන පරිදි මාර්ග සැළැස්මක් (එක් එක් අදියරේදී ඉටු කරන ලද කොටස් ඇතුළත්ව) ලිපිගොනුවට ඇතුළත් කර නොතිබුණි.
- මහා මාර්ග හා වාරිමාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (මග නැඟුම) ගේ 2009 දෙසැම්බර් 24 දිනැති අංක MH/MG/03/01/PEN දරන චක්‍රලේඛයට අනුව මාර්ගයට අතුරන ලද ගල්වල සම්පීඩන ශක්තිය දින 7කදී $N/mm^2$ 18 ට හෝ දින 28 කදී $N/mm^2$ 25 ට නොඅඩු විය යුතු විය. එබැවින් මාර්ගයට ගල් ඇල්ලීමට පෙර ගල්වල සම්පීඩන ශක්තිය පරීක්ෂා කර අදාල ප්‍රමිතියට එකගවන්නේ නම් එම ගල් ඇල්ලිය යුතු වුවත් ඉහත කර්මාන්තය 2013 නොවැම්බර් 13 දින අවසන් කර තිබූ බව වැඩ නිමි වාර්තාව අනුව නිරීක්ෂණය වූ අතර ගල්වල සම්පීණ්ඩන ශක්තිය පරීක්ෂා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ මධ්‍යම රසායනාගාරයට ගල් යැවීම 2013 නොවැම්බර් 20 දින සිදු කර තිබීමෙන් මාර්ගයට ගල් ඇතිරීමෙන් පසු අදාල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට යවා තිබූ බව නිරීක්ෂණය විය. එසේම යවා තිබූ ගල්වල සම්පිණ්ඩන ශක්තිය නොමැති බව 2013 නොවැම්බර් 28 දින දන්වා එවා තිබුණි. ඒ අනුව රු.832,932 ක් වැය කර අතුරා තිබූ ගල් අදාල ප්‍රමිතියට අනුකූල නොවීය. මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය විසින් 2014 ජනවාරි 03 දින මෙම ව්‍යාපෘතියේ වියදම වූ රු.1,418,854 ක මුදල ගෙවීම ප්‍රතික්ෂේප කර බිල්පත් නැවත සභාව වෙත එවා තිබුණි.

(ඈ) <u>ගොරකාගොඩ වෙන්දෙසිවත්ත මාර්ගය</u>

මෙම මාර්ගය දිගින් මීටර් 88 ක්ද, පළලින් මීටර් 2.44 ක් ද කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීමට රු.499,841 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2014 පෙබරවාරි 19 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- අවසන් ගෙවීම් වාර්තාව අනුව අයිතම අංක 1.2 යටතේ පවතින මාර්ගයේ උස් ස්ථාන කපා මට්ටම් කිරීම වෙනුවෙන් රු.19,669 ක මුදලක් ගෙවා තිබූ නමුත් මාර්ගය ආරම්භයේ සිට මීටර් 28 ක පමණ දුරක් දක්වා අතුරන ලද ගල් ගිලා බැස තිබුණි.
- මාර්ගයට අතුරන ගල්වල සම්පිණ්ඩන ශක්තිය දින 28 කදී $N/mm^2$ 25 ට නොඅඩු විය යුතු අතර මෙම මාර්ගයට අතුරන ලද කුට්ටි ගල්වල අවශ්‍ය සම්පිණ්ඩන ශක්තිය නොමැති බව මාර්ග සංවර්ධන අධිකාරියේ තත්ව පරීක්ෂණ වාර්තාවේ දන්වා තිබීමෙන් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර බිල්පත් නැවත සභාව වෙත එවා තිබුණි.

(ඉ) <u>ගිරිකොළ බටේ වලකඩ පානීය ජල යෝජනා ක්‍රමය</u>

ඉහත ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් රු.978,224 ක ඇස්තමේන්තුවක් සඳහා 2012 දෙසැම්බර් 03 දින ගිරිකොළ සමෘද්ධි බලකාය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. අවසන්

ගෙවීම් වශයෙන් රු.1,148,048 ක මුදලක් ගෙවා ජල ටැංකිය සකස් කර ජල නල එලීම සිදු කර වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණි. ශක්‍යතා වාර්තාව අනුව ප්‍රතිලාභීන් 600 ක් ඉලක්ක කර ඉදි කර තිබූ මෙම ව්‍යාපෘතියෙන් විගණිත දිනය වූ 2014 පෙබරවාරි 17 දින වන විටත් ප්‍රතිලාභීන්ට ජලය ලබාගැනීමට හැකි වන පරිදි මාර්ගය දෙපස ජල නල එලා නොමැති වීමෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ මුදල නිශ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි.

3.2 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------------------

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(අ) අනුව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද 1993 සිට 2006 දක්වා කාලය තුළ ගෙවා තිබූ රු.269,364 ක් වූ අත්තිකාරම් ශේෂය අයකරගැනීමට විගණිත දිනය වූ 2014 පෙබරවාරි 17 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 සිට 2011 දක්වා පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබූ රු.721,106 ක් සම්බන්ධයෙන් 2014 පෙබරවාරි 17 දින වන විටත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570, 571 හා 572 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලේ මාසික දායක මුදල් හා සේවක අර්ථසාධක අරමුදලේ මාසික දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා 2006 වර්ෂයේ සිට 2013 අගෝස්තු දක්වා රු.88,234 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණද විගණිත දිනය වූ 2014 පෙබරවාරි 18 දින වන විටත් එම ගෙවීම් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
------------------------------

(i) 1988 අප්‍රේල් 17 දින අංක 55/4 දරන ගැසට් පත්‍රයේ XIV අධිකාරයේ 218 වගන්තිය අනුව ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාපති/ උපසභාපති/ වැඩ අධිකාරී/ කාර්මික නිලධාරී හා සභාවේ ලේකම්වරයා බලය පවරන වෙනත් නිලධාරියෙකු යන අයගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව සතු ඉඩම් 79 සම්බන්ධයෙන් පරීක්ෂා කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647(අ) විධිවිධාන පරිදි වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(iii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

4. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) අයවැයකරණය
(iii) ආදායම් පරිපාලනය
(iv) වත්කම් කළමනාකරණය
(v) කොන්ත්‍රාත් පරිපාලනය